රාජ්‍ය අනුබද්ධ හා රාජ්‍ය දෙපාර්තමේන්තු වලද වැඩිවීම් වාර්තාගතය. කෙසේවෙතත් පසුගිය පස් වසරේ වාර්ෂික වර්ධන අනුපාතයන්ට අනුව වැඩිවූ සේවා නියුක්තියේ සැහෙන වර්ධනයන් මුල් තුන්වසර තුළ පැනනැගුණු බැව් පෙන්වන අතර, ඉන්පසු නව සේවා නියුක්ති අවස්ථාවල වර්ධනයේ සම තත්ත්වයක් දක්නට ලැබුණි.

**1 . 31 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්ති ඇස්තමේන්තු**

| වර්ෂය | රාජ්‍ය අංශය | | පෞද්ගලික අංශය | | එකතුව |
|---|---|---|---|---|---|
| | රාජ්‍ය | රාජ්‍ය අනුබද්ධ | ම.කො.ආ.කො. | අනෙකුත්[1] | |
| 1977 .. | 422,647 | 617,033 | — | 283,427 | 1,323,107 |
| 1978 .. | 446,085 | 681,034 | 261 | 321,690 | 1,449,070 |
| 1979 .. | 470,188 | 749,034 | 5,876 | 310,096 | 1,535,194 |
| 1980 .. | 476,086 | 769,122 | 10,538 | 348,597 | 1,604,343 |
| 1981 .. | 481,475 | 778,199 | 19,729 | 348,365 | 1,627,768 |
| 1982 .. | 484,802 | 784,370 | 24,926 | 320,753 | 1,614,851 |
| 1983 .. | 489,472 | 785,717 | 28,705 | ල·නො· | ල·නො· |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව සහ මහ කොළඹ ආර්ථික කොමිසම.

1. පදනම සේවක අර්ථසාධක අරමුදල් දත්තයන්ය.

පාරිභෝගික මුදල් සහ සමාජ ආර්ථික සමීක්ෂණයෙන් සොයාගත් පරිදි දනට පවතින සේවා නියුක්ති තත්වයෙන් පෙන්වන්නේ, සේවා වියුක්ති අනුපාතය 1978/79 දී සියයට 14.8 සිට 1981/82 දී සියයට 11.7 දක්වා අඩුවී ඇති බවයි. මෙම සේවා නියුක්ති අනුපාතය මෑත දශකයන් තුළ වාර්තාවූ අඩුම මට්ටම වේ.

## මිළ

1983 වර්ෂයේ මිළ හැසිරීමෙහි ප්‍රධාන ලක්ෂණය වූයේ, පසුගිය වර්ෂ දෙක තුළ දක්නට ලැබූ මිළ අඩුවීමේ ප්‍රවනතාවයට ප්‍රතිපක්ෂ වීමකි. අලෙවි කිරීමේ මූලික අවස්ථාවලදී මෙන්ම, සිල්ලර අලෙවි අවස්ථාවලදී ද මිළ වැඩිවීමේ ප්‍රමාණයෙහි වර්ධනයක් දිස්විය.

ඉකුත් දෙවසරෙහි දිස්වූ මිළ අඩුවීමේ ප්‍රවනතාවයට ප්‍රතිපක්ෂ වූ මෙම තත්ත්වය කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙන් මෙන්ම තොග වෙළඳ මිළ දර්ශකයෙන්ද පැහැදිලි වෙයි. 1982 වර්ෂයේ සියයට 10.8 ක වැඩිවීම හා සසඳන විට, 1983 වර්ෂයේ කොළඹ පාරිභෝගික–යන්ගේ මිළ දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය ඉකුත් වර්ෂයේ සාමාන්‍යයට වඩා සියයට 14 කින් වැඩිවිය. 1982 වර්ෂයේ සියයට 5.5 ක්වූ වැඩිවීම සමග සැසඳීමේදී, 1983 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ තොග වෙළඳ මිළ දර්ශකයේ අදාළ වැඩිවීම සියයට 25 කි. එසේ වුවද, 1983 දී කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයේ වර්ධන ප්‍රමාණය 1980 සහ 1981 වර්ෂවලට වඩා අඩු ය.

1983 වර්ෂයේ මිළ මට්ටමෙහි වැඩිවීමේ ඉහළ වර්ධන අනුපාතය, හේතූන් කීපයක ඒකා–බද්ධ ප්‍රතිඵලයකි. අපනයන භාණ්ඩයන්ගේ තියුණු මිළ වැඩිවීම මගින් දේශීය වෙළඳපොළෙහි එම ද්‍රව්‍යයන්ගේ මිළ වැඩිවීමක් ඇති කරන ලදී. පිරිවැටුම් සහ දුම්කොළ බදුවල ආරෝහන ප්‍රතිශෝධනයද, වැඩිවූ ප්‍රවාහන ගාස්තු සහ විශේෂයෙන්ම භූමිතෙල් ඇතුළු අත්‍යවශ්‍ය පාරි–භෝගික භාණ්ඩවල මිළෙහි ආරෝහන ප්‍රතිශෝධනයන්ද මෙහිලා මිළ මට්ටම් අවධාරණය කිරීමට දායක වූ අනෙක් ප්‍රධාන සාධකයන්ගෙන් සමහරෙකි.

# තොග අලෙවි මිල දර්ශකය

**1974 = 100**

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි උපදර්ශකයන් සියල්ලම පාහේ ඉහළ නැගුණ අතර, දර්ශකයේ වැඩිම බරතැබුමක් (සියයට 61.9) ඇති ආහාර කාණ්ඩයේ සිදුවූ සියයට 12.4 ක වැඩිවීම සමස්ථ දර්ශකය කෙරෙහි වඩා විශාල බලපෑමක් ඇති කළේය. වර්ෂයේ මුල්භාගයේ පිටි සහ පාන් මිළෙහි සිදුකල ආරෝහන මිළ ප්‍රතිශෝධනය සහ විශේෂයෙන්ම වර්ෂයේ අග භාගයේදී සිදුවූ පොල් සහ පොල්තෙල්වල අඛණ්ඩ මිළ ඉහළයාම දර්ශකයේ වැඩි වීම් වලට හේතු විය.

වර්ෂය තුළ අවස්ථා දෙකක දී සිදුවූ භූමිතෙල්වල මිළ වැඩිවීම ඉන්ධන සහ ආලෝකය කාණ්ඩයේ උපදර්ශකයෙහි සියයට 33.2 ක වැඩිවීමක් ඇති කළා පමණක් නොව සමස්ථ දර්ශකය කෙරෙහිද සැළකිය යුතු බලපෑමක් ඇති කළේය. විවිධ කාණ්ඩය සඳහා වූ උපදර්ශකය සියයට 15 කින් වැඩිවිය.

කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි අපනයන කාණ්ඩය සඳහා වූ උපදර්ශකය සියයට 44 ක තරම් ප්‍රමාණයකින් වැඩිවූ අතර, දේශීය හා ආනයන කාණ්ඩයේ දර්ශකයන් පිළිවෙලින් සියයට 12.8 කින් හා 9.5 කින් ඉහළ නැඟුණි.

වර්ෂය තුළ තොග වෙළඳ මිළ දර්ශකයේ සිදුවූ තියුණු වැඩිවීමට අපනයන භාණ්ඩයන්ගේ මිළෙහි ඇතිවූ සැළකිය යුතු මිළ ඉහළ යෑම් සාධක විය. අපනයන කාණ්ඩය සඳහා වූ උපදර්ශකය සියයට 67.6 ක තරම් ප්‍රමාණයකින් වැඩිවිය. උප අනුව වර්ග කරන ලද තෙවැදෑරුම් තේ වර්ග සියල්ලේම වාර්ෂික මිළ සාමාන්‍යය පසුගිය වර්ෂයේ එම මිළට වඩා සියයට 84.6 කින් වැඩිවිය. විශේෂයෙන්ම වර්ෂයේ අගභාගයේ දී පොල් සහ පොල්තෙල් මිළෙහි සිදුවූ මේ හා සමාන වැඩිවීම් ද, රබර් සහ කරදමුංගු වැනි අපනයන භාණ්ඩයන්ගේ ඉහළ මිළ ද මෙම වැඩි වීමට දායක වී ඇත.

දේශීය හා ආනයන කාණ්ඩයන්ගේ දර්ශක පිළිවෙලින් සියයට 5.9 කින් සහ 10.2 කින් වැඩිවිය. 1982 දී සියයට 10.4 කින් වැඩිවූ දේශීය කාණ්ඩයේ මිළ, මෙම වර්ෂයේදී ඊට වඩා අඩු තීව්‍ර භාවයකින් ඉහළ නැගිණි. මෙම වර්ෂයේ දර්ශකය වැඩිවීමට වී මිළ වැඩිවීම පැහැදිලිවම දායක වූ නමුත්, වෙනත් බොහොමයක් දේශීය භාණ්ඩ මිළ ගණන් සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවැතුණි.

සමාලෝචනයට භාජනය වී ඇති අවුරුද්ද තුළ තොග වෙළඳ මිළ දර්ශකයේ සෑම උපදර්ශකයක්ම පාහේ ඉහළ නැගිණි. කෙසේ වෙතත් ආහාර (සියයට 30) ඛණිජ තෙල් නිෂ්පාදන (සියයට 28.6) ප්‍රවාහන උපකරණ (සියයට 25.1) සහ විවිධ කාණ්ඩයේ (සියයට 22.4) උප දර්ශකයන්ගේ වැඩිවීම් අනෙකුත් කාණ්ඩවල වැඩිවීම් අභිබවා සිටියේය. කඩදාසි නිෂ්පාදන, රසායන හා රසායනික නිෂ්පාදන, ලෝහ නොවන නිෂ්පාදන සහ යන්ත්‍රෝපකරණ සඳහා වූ උපදර්ශකයන්ගේ වැඩිවීමේ ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 17.8, 16.5, 16.3 සහ 10.2 ක් විය.

පාරිභෝගික සහ අන්තර් භාණ්ඩ සඳහා වූ උපදර්ශකයන්හි වැඩිවීම් පිළිවෙලින් සියයට 28.9 ක් හා 15.8 ක්වූ අතර, ආයෝජන භාණ්ඩ සඳහා වූ උපදර්ශකය ඉහළ නැගුනේ සියයට 12.9 කිනි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල මගින් රැස්කර ගන්නා ලද, තෝරාගත් ආහාර ද්‍රව්‍යයන්ගේ මිළ සාමාන්‍යයන් මගින් පෙන්නුම් කරනුයේ 1982 සහ 1983 අතර ආහාර ද්‍රව්‍යයන් බොහොමයක සිල්ලර මිළ ඉහළ ගිය බවෙකි. තෝරාගත් ද්‍රව්‍යයන් කීපයක මිළ දක්වෙන අංක 1 . 32 සංඛ්‍යා සටහනින් මෙය පැහැදිළි වෙයි. සහල් සහ මිරිස්වල මිළ ඉහළයාම් අල්ප වූ නමුදු, පොල්, පහතරට එළවළු, මාළු සහ මස් මිළ ඉහළයාම තියුණු විය.

**1 . 32 සංඛ්‍යා සටහන**

**තෝරාගත් ආහාර ද්‍රව්‍යවල සිල්ලර මිළ සාමාන්‍යයන් 1982—1983.**

| ද්‍රව්‍යය | ඒකකය | 1982 රු. | 1983 රු. | වෙනස රුපියල්වලින් 1982-83 | වෙනස ප්‍රතිශතයකින් 1982-83 |
|---|---|---|---|---|---|
| සහල් .. .. | කිලෝඑකක් | 6·56 | 6·92 | 0·36 | 5 |
| උඩරට එළවළු .. .. | ,, | 6·01 | 6·98 | 0·97 | 16 |
| පහතරට එළවළු .. .. | ,, | 4·48 | 5·62 | 1·14 | 25 |
| අලවර්ග .. .. | ,, | 5·60 | 6·58 | 0·98 | 18 |
| මුහුදු මාළු .. .. | ,, | 22·73 | 27·02 | 4·29 | 19 |
| මස් (හරක්, එළු, ඌරු, කුකුළු) .. | ,, | 26·54 | 30·29 | 3·75 | 14 |
| වියළි මිරිස් .. .. | ,, | 30·02 | 32·44 | 2·42 | 8 |
| පොල් .. .. | ගෙඩියක් | 1·57 | 2·23 | 0·66 | 42 |

මූලය : දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල·
ශ්‍රී ලංකා මහ බැංකුව.

වෙනත් ද්‍රව්‍යයන්ගේ සහ සැසඳීමේදී සහල්වල මිළ ඉහළයාම පහළ මට්ටමක පැවතුණි. 1982 සිට සහල් මිළ වැඩිවීමේ වේගයෙහි අඩුවීමක් දක්නට ලැබුණි. පසුගිය අවුරුද්දේ මෙන්ම 1983 දී ද සහල් මිළ වැඩිවූයේ සියයට 5 කින් පමණකි.

පහත රට සහ උඩරට එළවළු දෙවර්ගයේම මිළ පැහැදිලි ලෙස ඉහළ ගිය අතර, උඩරට එළවළු සම්බන්ධයෙන් 1982 වූ සියයට 16 වැඩිවීම මේ වර්ෂයේද ඒ ලෙසම පැවතිණි. 1982 දී සියයට 18 ක් හා ඊටත් පෙර වර්ෂයේ සියයට 9 ක්වූ මිළ වැඩිවීම් හා සසඳා බැලීමේදී මෙම වර්ෂයේ පහතරට එළවළුවල මිළෙහි සියයට 25 ක තියුණු මිළ වැඩිවීමක් විදහා දක්වෙයි. මෙය පහතරට එළවළුවල මිළ වැඩිවීම් වේගවත්වීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි.

මුහුදු මාළු සහ මස්වල මිළ තියුණු ලෙස වැඩිවුවත්, එම වැඩිවීමේ අනුපාතය, 1982 වර්ෂයේ අනුපාතයට වඩා අඩුය. පසුගිය වර්ෂයේ සියයට 23 හා සසඳන විට මෙම වර්ෂයේ මුහුදු මාළු මිළ වැඩිවූයේ සියයට 19 කින් වූ අතර, ඒ ආකාරයෙන් මස්වල මිළ සාමාන්‍යය වැඩිවූයේ සියයට 16 කින් හා 14 කිනි. වියළි මිරිස් මිළ වාර්තා කළේ සියයට 8 ක මඳ වැඩිවීමකි.

1982 සහ 1983 අතර සියයට 42 වූ වාර්තාගත තියුණුතම මිළ වැඩිවීම වූයේ පොල් මිළෙහිය. මෙය පසුගිය අවුරුද්දේ සිදුවූ සියයට 10 ක මිළ අඩුවීමට ප්‍රතිවිරුද්ධ වූවකි. විශේෂයෙන් පසුගිය දෙමස තුළවූ නිෂ්පාදනයේ ඌනතාවය සහ පොල් නිෂ්පාදන සඳහා වූ අධික අපනයන මිළ මෙම මිළ නැගීමට සාධක වූයේය.

## වැටුප්

1983 වර්ෂයේ දී, සංවිධානය වූ හා සංවිධානය නොවූ යන දෙවැදෑරුම් අංශයන්හිම සේවකයන්ගේ නාමික වැටුප් වැඩිවිය. මෙම වර්ෂයේදී සංවිධානය නොවූ අංශයේ සමහර අනු අංශයන්හි විශේෂයෙන් වී සහ රබර් වගාවන්හි මූල්‍ය වැටුපෙහි වැඩිවීම 1982 වර්ෂයට වඩා වැඩිවිය. සංවිධානය වූ අංශයේ මූල්‍ය වැටුප් වැඩිවීම 1882 වර්ෂයට වඩා අඩු ප්‍රමාණයකින් වූ අතර කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් පෙන්වනු ලබන මිළ වැඩිවීමට මුහුණ දීමට තරම් ප්‍රමාණවත් නොවීය.[1]

1. කොළඹ වැඩකරන පංතියේ වියදම් රටාව මත පදනම් වන කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් අවධමනය කිරීමෙන්, ග්‍රාමීය හා වතු අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල වෙනස්වීම් ගණන් බැලීම කිසිසේත් තත්ත්වානුකූල නොවන බැවින්, සංවිධානය නොවූ පෞද්ගලික අංශයේ මූල්‍ය වැටුප් කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් අවධමනය කිරීමක් නොකෙරිණි.